**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**යක්කල**

**පුරප්පාඩු**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයට පහත තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2019.02.28 දින තෙක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු: *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) /කථිකාචාර්ය (පරිවාස)***

| **ආයුර්වේද මූලධර්ම අධ්‍යයනාංශය** | | | | |
|---|---|---|---|---|
| **තනතුර** | **විෂය ක්ෂේත්‍ර** | **මූලික සුදුසුකම්** | **පශ්චාත් උපාධි සුදුසුකම්** | **පලපුරුද්ද** (ඉගැන්වීම්/ පර්යේෂණ/වෘත්තීය ක්‍රියාකාරකම්/ පශ්චාත් උපාධි කටයුතු) |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) කථිකාචාර්ය (පරිවාස) | • ආයුර්වේද වෛද්‍ය විද්‍යා ඉතිහාසය[1]<br>• මානවශරීරරචනාවිඥාන[2] | ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (BAMS)* | මෙහි සඳහන් විෂයන්ට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් සහ පලපුරුද්ද සහිත වීම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය - අවම වශයෙන් වසර දොළහක (12)පලපුරුද්දක් සහිත වීම (එයින් අවම වශයෙන් වසර හයක් (06) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය )<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - අවම වශයෙන් වසර හයක (06) පලපුරුද්දක් සහිත වීම |

සටහන්: *BAMS උපාධිය සහිත අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

[1] සංස්කෘත පිළිබඳ මනා දැනුමක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

[2] මෘත ශරීර ව්‍යවච්ඡේදය පිළිබඳ පලපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

| **ද්‍රව්‍යගුණ විඥාණ අධ්‍යයනාංශය** | | | | |
|---|---|---|---|---|
| **තනතුර** | **විෂය ක්ෂේත්‍ර** | **මූලික සුදුසුකම්** | **පශ්චාත් උපාධි සුදුසුකම්** | **පලපුරුද්ද** (ඉගැන්වීම්/ පර්යේෂණ/වෘත්තීය ක්‍රියාකාරකම්/ පශ්චාත් උපාධි කටයුතු) |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය/<br>කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)<br>කථිකාචාර්ය (පරිවාස) | • ද්‍රව්‍යගුණ විඥාණ<br>• හෛසජ්ජ්‍ය කල්පනා<br>• රස ශාස්ත්‍ර | ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (BAMS)* | මෙහි සඳහන් විෂයන්ට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් සහ පලපුරුද්ද සහිත වීම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය - අවම වශයෙන් වසර දොලහක (12)පලපුරුද්දක් සහිත වීම (එයින් අවම වශයෙන් වසර හයක් (06) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය )<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - අවම වශයෙන් වසර හයක (06) පලපුරුද්දක් සහිත වීම |

සටහන්: *BAMS උපාධිය සහිත අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.
ඉහත විෂය සංකලනයන් තුනම ඉගැන්විය හැකි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

| **චිකිත්සා අධ්‍යයනාංශය** | | | | |
|---|---|---|---|---|
| **තනතුර** | **විෂය ක්ෂේත්‍ර** | **මූලික සුදුසුකම්** | **පශ්චාත් උපාධි සුදුසුකම්** | **පලපුරුද්ද** (ඉගැන්වීම්/ පර්යේෂණ/වෘත්තීය ක්‍රියාකාරකම්/ පශ්චාත් උපාධි කටයුතු) |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය/<br>කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)<br>කථිකාචාර්ය (පරිවාස) | • මානව චිකිත්සා<br>• අගද තන්ත්‍ර<br>• දේශීය චිකිත්සා<br>• රෝග විඥාණ | ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (BAMS)* | මෙහි සඳහන් විෂයන්ට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් සහ පලපුරුද්ද සහිත වීම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය - අවම වශයෙන් වසර දොලහක (12)පලපුරුද්දක් සහිත වීම (එයින් අවම වශයෙන් වසර හයක් (06) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය )<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - අවම වශයෙන් වසර හයක (06) පලපුරුද්දක් සහිත වීම |

සටහන: *BAMS උපාධිය සහිත අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

ඉහත විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

| ශල්‍යශාලාක්‍ය අධ්‍යයනාංශය | | | | |
|---|---|---|---|---|
| **තනතුර** | **විෂය ක්ෂේත්‍ර** | **මූලික සුදුසුකම්** | **පශ්චාත් උපාධි සුදුසුකම්** | **පලපුරුද්ද** (ඉගැන්වීම්/ පර්යේෂණ/වෘත්තීය ක්‍රියාකාරකම්/ පශ්චාත් උපාධි කටයුතු) |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) කථිකාචාර්ය (පරිවාස) | • ශාලාක්‍ය තන්ත්‍ර | ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (BAMS)* | මෙහි සඳහන් විෂයට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් සහ පලපුරුද්ද සහිත වීම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය - අවම වශයෙන් වසර දොළහක (12)පලපුරුද්දක් සහිත වීම (එයින් අවම වශයෙන් වසර හයක් (06) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය )<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - අවම වශයෙන් වසර හයක (06) පලපුරුද්දක් සහිත වීම |

සටහන්: *BAMS උපාධිය සහිත අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.
ශල්‍ය තන්ත්‍ර විෂය ඉගැන්විය හැකි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වැටුප් පරිමාණ:**

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (U-AC3 (I))
   අදාල වැටුප් පරිමාණයේ රු.81,638 (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. (2019.01.01 දින සිට)
   රු.91,310-7 x 2,170 -රු 106,500 මාසික (2020.01.01 දින සිට)

2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය (U-AC 3(II) )
   අදාල වැටුප් පරිමාණයේ රු.71,028 (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. (2019.01.01 දින සිට)
   රු.79,360-11x1,630- රු 97,290 මාසික (2020.01.01 දින සිට)

3. කථිකාචාර්ය (තහවුරු නොකල) (U-AC 3(III) )
   අදාල වැටුප් පරිමාණයේ රු.62,344 (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. (2019.01.01 දින සිට)
   රු.69,580- 5x1,630- රු 77,730 මාසික (2020.01.01 දිනසිට)

4. කථිකාචාර්ය (පරිවාස) (U-AC 3(IV) )
   අදාල වැටුප් පරිමාණයේ රු.49,053 (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. (2019.01.01 දින සිට)
   රු.54,600-10x1,335- රු 67,950 මාසික (2020.01.01 දිනසිට)

(මෙයට අමතරව පත්වීම්ලාභීන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ලැබීමට හිමිකම ලබයි. තවද ඔවුන් වෙත අධ්‍යන දීමනාව වශයෙන් තනතුරු 1 හා 2 සඳහා අදාළ වැටුපෙන් 151% සහ තනතුර 3 සඳහා අදාළ වැටුපෙන් 131% සහ තනතුර 4 සඳහා අදාළ වැටුපෙන් 115% සහ පර්යේෂණ දීමනාව ලෙස අදාළ වැටුපෙන් 35% ගෙවනු ලැබේ.)

**සප්ත වාර්ෂික නිවාඩු**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය හෝ ඉන් ඉහළ තනතුරු දරන්නන් සඳහා එක් අවුරුදු වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු හෝ අවුරුදු දෙකක වැටුප් රහිත නිවාඩු සඳහා වසර හතක සේවාකාලය අවසානයේ සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගතකරනවිට ඒ සඳහා ගුවන්යාන පත්‍ර ගාස්තු ලැබීමේ හිමිකම අයදුම්කරුට මෙන්ම කලත්‍රයාට ද හිමි වේ.

**ප්‍රතිලාභ**
මාසික වැටුපෙන් 10% ක් අර්ථසාධක අරමුදලට බැර වන අතර, විද්‍යායතනය විසින් බැර කරනු ලබන 15% ක මුදලින් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. තව ද මාසික වැටුපෙන් 3% කට සමාන මුදලක් සේවා නියුක්ති භාරකාර අරමුදලට විද්‍යායතනය විසින් බැර කරනු ලැබේ.

**අයදුම්කරන පිළිවෙල**
මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1997.11.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 සහ එහි සංශෝධනයන්ට අනුව) කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී/පාලන අංශය (033 222 6618) වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලය ඔස්සේ විද්‍යායතන වෙබ් අඩවියට පිවිස (**gwai.kln.ac.lk**) අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ඉල්ලීමක් සහිත ව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී 23x10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග **2019.02.28** දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී/පාලන අංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, නුවර පාර, යක්කල යන ලිපිනයට ලැබෙන සේ **ලියාපදිංචි** තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු අතර සුදුසුකම්වලට අනුකූල නොවන, අසම්පූර්ණ හෝ අපැහැදිලි, නියමිත ආකෘතියෙන් බැහැර වූ (විද්‍යායතන වෙබ් අඩවියෙන් ලබානොගත් අයදුම්පත්) හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ **වම් පස උඩ කෙළවරෙහි** ඉල්ලුම්කරනු ලබන තනතුර සහ අධ්‍යනාංශය සඳහන් කළයුතුය.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන්** තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත්කළ යුතු වේ. එවැනි අයදුම්කරුවන් තම අයදුම්පතෙහි පිටපතක් (advanced copy) ඉහත ලිපිනයට අවසන් දිනට ප්‍රථම එවීමට වග බලා ගත යුතු ය.

යෝග්‍යතාවයට අනුව තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට හිමිකමක් විද්‍යායතනය සතුය.

අධ්‍යක්ෂ
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය
යක්කල
2019.01.29